පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

ශ්‍රේණිය - 8

සතිය - 7

Prepared by- පී.ව්.එම්.ආර්.ආර්.ආර්.ඒකනායක

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## තෝරා ගත් නළුවන් සමඟින් පෙළ රූපණයෙන් සරසමු

රූපණය යනු රඟපෑම බවත් නාට්‍යයේ සාර්ථකත්වය සඳහා රූපණ ශිල්පීන්ගේ දූඩි කැපවීම හා උවමනාව තිබිය යුතු බවත් ඉහත සාකච්ඡා කළෙමු. වේදිකා නාට්‍යයක් රඟදැක්වීම සාමූහික ක්‍රියාවලියකි. සාර්ථක නාට්‍යයක් නිර්මාණය කිරීම සඳහා රූපණයට සම්බන්ධ වන නළු නිළියන් මෙන් ම සෙසු ශිල්පීන් ද එකා මෙන් වෙහෙසී ක්‍රියා කළ යුතු ය.

තෝරාගත් නළු නිළියන් සමග තෝරාගත් නාට්‍ය පිටපතක් රඟදැක්වීම සිදු කළ යුතු ආකාරය පිළිබඳ ව මෙම පාඩමේ දී අවධානය යොදමු.

- නාට්‍ය පුහුණුව සංවිධානය කිරීම සඳහා නායකත්වය ගත යුතු අයෙකු සිටිය යුතු යි. නාට්‍ය පුහුණුවේ දී මූලිකත්වය ගන්නා තැනැත්තා නාට්‍ය නිෂ්පාදක යනුවෙන් හැඳින් වේ.
- කාර්ය පහසුව සඳහා අවශ්‍ය වූ විට සහාය නිෂ්පාදකයකු ද යොදාගත හැකි වේ.
- ප්‍රධාන චරිත හැරුණුවිට සෙසු චරිත ද රූපණයේදී වැදගත් වේ.
- චරිතවල මුහුණ, අතපය ආදි ශරීරාංග උපයෝගි කරගැනීම, සංවාද භාවිතය, හැඟීම් ප්‍රකාශ කිරීම, රූපණයේ දී ඉතා වැදගත් වේ. එනම් සතර අභිනය සුදුසු පරිදි රූපණය සඳහා යොදා ගත යුතු ය.
- නාට්‍ය පුහුණු ව සඳහා කාලසටහනක් සකසාගත යුතු ය.
- පුහුණුවීම් කටයුතු සංවිධානාත්මක ව කළ යුතු දෙයක් බැවින් ඒ සඳහා කාල කළමනාකරණය වැදගත් වේ.
- නාට්‍ය පෙළට අදාළ ව රූපණය ඉදිරිපත් කිරීමේදී චරිතවල අභ්‍යන්තර හා බාහිර ලක්ෂණ පිළිබඳමනා අවබෝධයක් තිබිය යුතු වේ.
- සතත අභ්‍යාසය නොහොත් රංග අභ්‍යාසවල නිරත වෙමින් චරිතය අධ්‍යයනය කරමින් කරනු ලබන පුහුණුව රූපණය සාර්ථක ව ඉදිරිපත් කිරීමට හේතු කාරක වේ.

අභ්‍යාස (පිළිතුරු ලියන්න)

1. නාට්‍ය නිෂ්පාදක නාට්‍ය නිර්මාණයේ දී ගන්නා වගකීම් 3ක් ලියන්න.
2. නාට්‍ය පුහුණුවීමක දී නළු නිළියන් විසින් ලබා දිය යුතු දායකත්වය කෙටියෙන් ලියන්න.
3. නාට්‍යයක් සාර්ථක කර ගැනීම සඳහා සාමූහිකත්වය වැදගත් වන්නේ කෙසේ ද?